මධ්‍යම සංස්කෘතික අරමුදල

மத்திய கலாசார நிதியம்

CENTRAL CULTURAL FUND

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය
රැකගැනීමට අත දෙන්න

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT

2012

මධ්‍යම සංස්කෘතික අරමුදල
மத்திய கலாசார நிதியம்
CENTRAL CULTURAL FUND

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය
රැකගැනීමට අත දෙන්න

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT 2012

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

පටුන — පිටුව

02	මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිස්වන වාර්ෂික වාර්තාව - 2012	01 - 37
03	2012 දෙසැම්බර් 31 වනදායින් අවසන් වර්ෂයේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව	38 - 52
04	මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වූ වර්ෂයේ ශේෂ පත්‍රය	53 - 56

உள்ளடக்கம் — பக்கம்

01.	மத்திய கலாசார நிதியத்தின் பதினெட்டாவதுவருடாந்த அறிக்கை – 2012	57 - 102
02.	2012 டிசெம்பர் மாதம் 31 ஆம் திகதியுடன் முடிவடைந்த ஆணடின் மத்திய கலாசார நிதியத்தின் கணக்குகள் பற்றிய கணக்காய்வாளர் நாயகரின் அறிக்கை	103 - 121
03	மத்திய கலாசார நிதியம் - 2012 டிசெம்பர 31 ஆம் திகதியுடன் முடிவடைந்த ஆண்டிற்கான வருமான செலவினக் கணக்குகள்	122 - 125

CONTENTS — PAGE

01.	Thirty Annual Report of the Central Cultural Fund - 2012	126 - 170
02.	The Report of the Auditor General on the Accounts of the Central Cultural Fund for the year ended 31st December 2012	171 - 185
03.	Balance Sheet of the Central Cultural Fund as at 31st December 2012	186 - 189

මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිස්වන වාර්ෂික වාර්තාව - 2012

පාලක මණ්ඩලය

2012 වර්ෂයට අදාළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය.

පාලක මණ්ඩලයේ සභාපති
අග්‍රාමාත්‍ය ගරු දි.මු. ජයරත්න මැතිතුමා

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය

ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා
නියෝජ්‍ය මුදල් අමාත්‍ය

බැසිල් රාජපක්ෂ මැතිතුමා
ආර්ථික සංවර්ධන අමාත්‍ය

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය

ගරු එස්. අමරසේකර මහතා
අග්‍රාමාත්‍ය ලේකම්

විමල් රූබසිංහ මහතා
ලේකම්,
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (2012 මැයි මාසයට පෙර)

වසන්ත ඒකනායක මහතා
ලේකම්,
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (2012 මැයි මාසයට පසු)

ආචාර්ය සෙනරත් දිසානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත් කල සාමජිකයින්

ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය

ඩබ්.ඒ. රණවීර මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
මධ්‍යම සංස්කෘතික අරමුදල

ආරාධිත භවත්හු

එන්. ගොඩකන්ද මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යය මණ්ඩලය

1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිළධාරී වශයෙන් කටයුතු කරනු ලබයි. ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරනු ලබන අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමස්ථ කාර්ය භාරය සංවර්ධන, පාලන සහ මුදල් වශයෙන් ප්‍රධාන අංශ තුනක් යටතේ විෂයභාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ මෙහෙයවීමෙන් සිදු කර ගෙන යනු ලබයි.

මෙම කාර්ය භාරය ඉටුකර ගෙන යාම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය වසර තුළදී සේවයේ යොදවා ගන්නා ලදි.

කළමනාකරණ මට්ටමේ නිළධාරීන්	19
කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිළධාරීන්	50
පුරාවිද්‍යා පර්යේෂණ නිළධාරීන්	57
සංරක්ෂණ නිළධාරීන්	52
බිතුසිතුවම් සංරක්ෂක නිලධාරීන්	19
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවලට අදාල නිළධාරීන්	209
කම්කරු ශ්‍රේණිවලට අදාල සේවකයින්	1646
අනියම් පදනමින් සේවයේ යොදවා ගත් සේවකයින්	04
	2056

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

විමල් රූබසිංහ
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සහ
ප්‍රධාන පරිපාලන නිලධාරී
මධ්‍යම සංස්කෘතික අරමුදල
(2012 මැයි මාසයට පෙර)

වසන්ත ඒකනායක
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සහ
ප්‍රධාන පරිපාලන නිලධාරි
මධ්‍යම සංස්කෘතික අරමුදල
(2012 මැයි මාසයට පසු)

මධ්‍යම සංස්කෘතික අරමුදල
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යාඥ මහාචාර්ය ගාමිණි අදිකාරී
අධ්‍යක්ෂ ජනරාල්
(2012 මැයි මාසයට පසු)

ඩබ්.ඒ. රණවීර
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

ඩබ්.පී. සරත්
අධ්‍යක්ෂ (මුදල්)

පී.එම්.ජී. මල්දෙණිය
අධ්‍යක්ෂ (සංවර්ධන)

පුරාවිද්‍යාඥ ගාමිණී දොඩම්වල
සහකාර අධ්‍යක්ෂ (පාලන)

ඩී.ඒ.සි. දඹදෙණිආරච්චි
සහකාර අධ්‍යක්ෂ (ප්‍රකාශන)
අතපත්තු කාර්යාලය

කණිෂ්ඨ කළමනාකරණ මණ්ඩලය
මධ්‍යම සංස්කෘතික අරමුදල

ඩයස් වගාච්චි
ව්‍යාපෘති කළමනාකරු
පොළොන්නරුව ව්‍යාපෘතිය

එච්.එම්.එම්. හේරත්
ව්‍යාපෘති කළමනාකරු
මහනුවර ව්‍යාපෘතිය

ආර්.එම්.ජී.බී. රත්නායක
ව්‍යාපෘති කළමනාකරු
තිස්සමහාරාම ව්‍යාපෘතිය

වසරේ භෞතික ප්‍රගතිය

මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීමේ එක් ප්‍රධාන පරමාර්ථයක් වනුයේ ශ්‍රී ලංකාවේ ඇති පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කර අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීමයි. මේ යටතේ ආරම්භ කළ අභයගිරිය හා ජේතවන ස්තූප සංරක්ෂණය දැනට අවසන් කර ඇති ජාතික වශයෙන් වැදගත්කමක් හා විශාල වියදමක් දැරූ ව්‍යාපෘති වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් දැනට ආරම්භ කොට පවත්වාගෙන යන ව්‍යාපෘති වනුයේ,

- අභයගිරිය
- ජේතවනය
- සීගිරිය
- පොළොන්නරුව
- මහනුවර
- තිස්සමහාරාමය
- ගාල්ල
- රම්බාවිහාරය
- දඹුල්ල
- වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය (යාපහුව, දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල)
- රුහුණු සංස්කෘතික කලාපය

2012 වර්ෂය සඳහා කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ කාර්යයන් 82 ක් ද, සංරක්ෂණ වැඩබිම් 151 ක් ද වශයෙන් වැඩබිම් 233 ක් යෝජනා වී තිබුණි. මින් 200 ක වැඩ ආරම්භ කිරීමට හැකි වූ අතර, එයින් 42 ක වැඩ නිම කිරීමට හැකි විය. (කැණීම් 11, සංරක්ෂණ 31)

වර්ෂය තුළ දී ඒකක 137,478.04 ක් සිදු කල අතර එහි භෞතික ප්‍රගතිය 71.2% කි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා සෘජු වියදම් වශයෙන් රුපියල් මිලියන 317.13 ක් වැය කළ අතර, සෘජු වියදම් ප්‍රගතිය 57.7% කි. වර්ෂය පුරා මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා මිනිස් දින 250,538 ක් වැය කරන ලදි.

ඒ ඒ ව්‍යාපෘතිවල සංක්ෂිප්ත විස්තර පහතින් දක්වා ඇත.

අභයගිරිය ව්‍යාපෘතිය

කැණීම් අංශය

මේ යටතේ කුට්ටම් පොකුණ අසල ගොඩනැගිල්ල, ස්තූපයේ බටහිර දොරටුව, ථූපාරාම පැරණි රෝහල් සංකීර්ණය, ථූපාරාමයේ භූ දර්ශණ සඳහා කැණීම්, රුවන්වැලි සංකීර්ණයේ පැරණි රෝහල යන ස්ථානවල කැණීම් කටයුතු සිදු කරන ලදි. කුට්ටම් පොකුණ අසල ගොඩනැගිල්ල හා ථූපාරාමයේ භූ දර්ශණ සඳහා කැණීම් අවසාන කරන ලදි. ස්තූප පරිශ්‍රයේ කැණීම් සිදු කරන ලද්දේ සංරක්ෂණ අංශයේ අවශ්‍යතාවය මත පමණි.

කැණීම් අංශය යටතේ කෞතුකාගාරයේ දෛනික නඩත්තු හා නරඹන්නන් දැනුවත් කිරීම, පුස්තකාලය හා ලේඛනාගාරය, රසායනාගාරය හා පර්යේෂණ / ප්‍රකාශන යන කාර්යයන් ද වර්ෂය මුළුල්ලේම සිදු කරන ලදි.

ථූපාරාමයේ භූ දර්ශන සඳහා කැණීම්

සංරක්ෂණ අංශය

ස්තූප පරිශ්‍රයේ සංරක්ෂණ කටයුතු සඳහා තව දුරටත් ප්‍රමුඛතාවය ලබා දෙන ලදි. ස්තූප ගර්භයේ ගඩොල් වැඩ හා කුස්තුර පිරවීම් අවසාන කරන ලද අතර, මෙම කාර්යයට අපේක්ෂා නොකළ පරිදි වැඩි කාලයක් ගත වූයේ ගර්භයේ ඉහළ කොටස්වල පැරණි ගඩොල් මුළුමනින් ම ඉවත් කර අළුත් ගඩොල් යෙදිය යුතු වූ නිසාය. ගර්භයේ සංරක්ෂණය සඳහා ශ්‍රමදාන මගින් ද විශාල පිටුවහලක් ලැබුණි.

ගර්භය සංරක්ෂණය අවසාන කළ පසු ඇතුළු ප්‍රාකාරයත් සලපතල මළුව, පේසාව හා ස්ථූප පිට ප්‍රාකාරයේත් වැඩ ආරම්භ කරන ලදි. ඇතුළු ප්‍රාකාරයේ ද අනපේක්ෂිත ලෙස කළුගල් විශාල ප්‍රමාණයක් ගලවා නැවත බැඳිය යුතු විය. පසුගිය වසර කීපයම පේසාවේ ආරක්ෂාව සඳහා එය පස්වලින් ආවරණය කර තිබුණි. ගර්භයේ වැඩ අවසාන කළ පසු එම පස් ඉවත් කරමින් පේසාව පාදා ගත් අතර, සංරක්ෂණය කළ යුතු කොටස්වල වැඩ ආරම්භ කරන ලදි.

සළපතලමළුවේ සංරක්ෂණ කටයුතු වසරේ අවසාන කාර්තුවේ දී වඩාත් වේගවත්ව සිදු කරන ලදි. මේ සඳහා ද ශ්‍රමදාන මගින් විශාල කාර්යය ප්‍රමාණයක් ඉටු කළ අතර, වැලි මළුවේ හා පිටත ප්‍රාකාරයේ ද ඉතුරු වී ඇති සංරක්ෂණ කාර්යයන් අඛණ්ඩව සිදුකෙරිණි.

ස්ථූප පරිශ්‍රයට අමතරව ලංකාරාම ගොඩනැගිලි අංක 16, ථූපාරාම පරිශ්‍රයේ ඉතුරු වැඩ (බෝධිසරය හා පිට ප්‍රාකාරය), අංක 30 E ගොඩනැගිල්ල, වැඩබිම් අංක 08 හි චංකමනසරය යන සංරක්ෂණ කාර්යයන් සිදු කළ අතර ලංකාරාම පිළිමගේ (අංක 16) 30 E ගොඩනැගිල්ල හා චංකමනසරය සංරක්ෂණය අවසාන කරන ලදි. ථූපාරාම බෝධිසරයේ ද පළමු අදියරේ සංරක්ෂණ කටයුතු නිම කරන ලදි.

පුරාවිද්‍යා භූමියේ සංචාරක අවව්‍යුහ පහසුකම් දියුණු කිරීම සඳහා ද වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. සඳකඩ පහන අසල පෙත්මග නැවත සකස් කිරීම, ප්‍රධාන රසායනාගාරයේ ගොඩනැගිල්ල අළුත්වැඩියාව, කෞතුකාගාරයේ වැසිකිළි අළුත්වැඩියාව, වාහන සේවා ස්ථානය සකස් කිරීම මේ යටතේ සිදු කෙරිණි.

මීට අමතරව පර්යේෂණ හා ප්‍රකාශන, විද්‍යාත්මක නඩත්තු හා අභයගිරි, මහාවිහාර හා ස්ථූප පරිශ්‍රයේ දෛනික නඩත්තු ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

ජේතවන ව්‍යාපෘතිය

කැණීම් අංශය

පසුගිය වසර කිහිපයේ මෙන් ම 2012 වර්ෂයේ දී ද ව්‍යාපෘතියේ කැණීම් කටයුතු අවම මට්ටමකින් පවත්වා ගෙන යන ලදි. මෙයට ප්‍රධාන හේතුව වූයේ කම්කරුවන් වැඩි පිරිසක් අභයගිරි ස්ථූප පරිශ්‍රයේ සංරක්ෂණ කාර්යය කඩිනම් කිරීම සඳහා යෙද වූ බැවිනි.

මහින්ද පිරිවෙණ අසල පර්යේෂණ කැණීම ආරම්භ කරන ලද නමුත් අධික වර්ෂාවෙන් කැණීම් භූමිය ජලයෙන් යට වීම නිසා අත්හිටුවීමට සිදුවිය. මොණර මාළිගයේ කැණීම් ද වර්ෂයේ අවසාන කාලයේ දී ආරම්භ කෙරිණි.

කැණීම් අංශය යටතේ පර්යේෂණ හා විශ්ලේෂණ (පුරාවස්තු - අස්ථි, පබළු, පාෂාණ, ලෝහ, තඹ ආදිය), පුරාවිද්‍යා වාර්ෂික වාර්තා සකස් කිරීම, කෞතුකාගාරය, සෙල්ලිපි පර්යේෂණ වාර්තා, උප රසායනාගාරය යන කාර්යයන් ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

අනුරාධපුරය, පොළොන්නරුව හා සීගිරිය ලෝක උරුම නගර පිළිබඳව නිර්මාණය කළ වර්තාමය චිත්‍රපටය සඳහා ද රු.මි. 5.94 ක වියදම් කරන ලදි.

මොණර මාළිගයේ සිදු කරන ලද කැණීම්

සංරක්ෂණ අංශය

බෝධිසරයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කළ ද, තාක්ෂණික ගැටළුවක් පිළිබඳ පුරාවිද්‍යා උපදේශක සභාවේ තීරණය ලැබෙන තුරු අත්හිටුවන ලදි. මීට අමතරව ආරම්භ කළ අනෙක් ප්‍රධානම කාර්යය වූ ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේ සීමා බැම්ම හා ඒ ආශ්‍රිත ස්මාරක සංරක්ෂණය කිරීම ද අත්හිටුවීමට සිදු වූයේ ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සැපයූ රන්වැට අරමුදල සඳහා නව පාලක මණ්ඩලයක් පත් කල යුතු වූ බැවිනි. ස්ථූපයේ පේසාවේ හා ඇත් පවුරේ පැරණි බදාම නියාමනය හා ස්ථානීය සංරක්ෂණ කටයුතු ද සිදුකෙරිණි.

ව්‍යාපෘතියේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් කෞතුකාගාර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කරන ලද අතර, ගොඩනැගිල්ල වටා කම්බි වැට හා නව ප්‍රවේශ දොරටුවක් ද සකස් කරන ලදි.

සංරක්ෂණ අංශය යටතේ පුරාවිද්‍යා භූමි ප්‍රදේශයේත්, සංරක්ෂිත ස්මාරකවලත් විද්‍යාත්මක නඩත්තු හා සාමාන්‍ය නඩත්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය.

පොළොන්නරුව ව්‍යාපෘතිය

කැණීම් අංශය

පිටත නුවර ගවේෂණ කටයුතු හා කැණීම් කටයුතු වර්ෂය මුළුල්ලේම සිදු කරන ලදි. දිඹුලාගල අවට ගවේෂණ කටයුතු ද ක්‍රියාත්මක වූ අතර, වර්ෂා කාලයේ දී අත්හිටුවීමට සිදුවිය.

කැණීම් අංශය යටතේ මාසික දේශණ / සම්මන්ත්‍රණ හා වැඩමුළු ද, ඒ ආශ්‍රිත සඟරාව ද, පුස්තකාලය, රසායනාගාරය හා කෞතුකාගාරයේ දෛනික නඩත්තු, නරඹන්නන් දැනුවත් කිරීම් ද ක්‍රියාත්මක විය.

අනුරාධපුර, පොළොන්නරු හා සීගිරිය ලෝක උරුම නගර පිළිබඳව සුදත් රෝහණ මහතා විසින් අධ්‍යක්ෂණය කළ වාර්තා චිත්‍රපටයක් නිර්මාණය කරන ලදි. මේ සඳහා රු.මි. 5.94 ක් වැය විය.



නැගෙනහිර වෙහෙර කැණීම

සංරක්ෂණ අංශය

මේ යටතේ ඇතුළු නුවර නැගෙනහිර ප්‍රාකාර බැම්ම හා උතුරු දොරටුව, විජයබාහු මාළිගය, අංක 02 ශිව දේවාලය අසළ පැරණි ගඩොල් බැමි හා කිරි වෙහෙර ආයත වල ඉතුරු සංරක්ෂණ වැඩ ක්‍රියාත්මක කරන ලදි. කිරිවෙහෙර සුදු හුණු පිරියම් කිරීම අවසන් වූ පසු ආයක වල ප්‍රතිසංස්කරණ කටයුතු ද ආරම්භ කරන ලදි.

ගල් විහාරයේ පියැස්ස සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් දෙවන වරට ඉදිරිපත් කළ ඇස්තමේන්තුව රු.මි. 7.8 ක් වූ අතර, ඒ පිළිබඳව අවසාන තීරණය ටෙන්ඩර් මණ්ඩලය මඟින් ගත යුතු විය.

ව්‍යාපෘතියේ මාර්ග පද්ධතිය නිරතුරුවම අළුත්වැඩියා කළ යුතු හෙයින් අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය මත කොන්ක්‍රීට් ගල් අතුරා සකස් කිරීම ආරම්භ කළ අතර, මාර්ග සංවර්ධන අධිකාරිය හා වෙනත් කොන්ත්‍රාත් සමාගමක් මඟින් කිලෝමීටරය බැගින් ගල් ඇතිරීම සිදු කරන ලදි. මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මේ සඳහා ඉදිරිපත් කළ මුල් ඇස්තමේන්තුව රු.මි. 58 ක් වූ අතර, මෙය නැවත සංශෝධනය කරන ලදි.

ආදිත්‍ය නේවාසිකය නවීකරණය කර සංචාරක නිකේතනයක් වශයෙන් භාවිතය ආරම්භ කරන ලදි. ගල් විහාරය අසල වෙළඳ කුටි ඉදිකිරීම අවසාන කෙරිණි. මීට අමතරව ගල් විහාරය අසළ රථ ගාල සකස් කිරීම ද ආරම්භ කළ අතර, පස් තලා මට්ටම් කිරීම අවසාන කරන ලදි.

සංරක්ෂණ අංශය යටතේ වාර්තා සකස් කිරීම, විද්‍යාත්මක නඩත්තු හා පුරාවිද්‍යා භූමි ප්‍රදේශයේ සාමාන්‍ය නඩත්තු ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

2012 වර්ෂයේ දී පොළොන්නරුව ව්‍යාපෘතිය මඟින් සංචාරක යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ඉහත වැඩ සටහන් ක්‍රියාත්මක කළ අතර, මේ සඳහා රු.මි. 12.91 ක් එනම් සංරක්ෂණ අංශයේ මුළු වියදමෙන් 45% කි.

කිරිවෙහෙර ආයතවල සංරක්ෂණ කටයුතු සිදු කිරීම

කිරිවෙහෙර ආයතවල සංරක්ෂණ කටයුතු සිදු කිරීමෙන් පසු

සීගිරිය ව්‍යාපෘතිය

කැණීම් අංශය

ඇතුළු දිය අගලේ උතුරු කොටස කැණීම් ආරම්භ කිරීම සඳහා ගවේෂණ හා මිණුම් කටයුතු වර්ෂයේ මුල් කාර්තුවේ දී සිදු කරන ලදි. උතුරු දොරටුව පරිශ්‍රයේ පර්යේෂණ කැණීමක් ද සිදු කෙරිණි.

මීට අමතරව ගවේෂණ හා කැණීම් වාර්තා මුද්‍රණය සඳහා සකස් කිරීම, පුරාවස්තු විශ්ලේෂණය හා දත්ත ගබඩාව, පුරාවස්තු සංරක්ෂණය, මැටි බඳුන් විශ්ලේෂණය යන කාර්යයන් ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

කෞතුකාරයේ විශේෂ ප්‍රදර්ශණ, ලේඛණාගාරය, මැදිරි සහ පුරාවස්තු දත්ත නියාමනය හා දෛනික නඩත්තුව ද සිදු කෙරිණි.

ඇතුළු දිය අගලේ කැණීම් කටයුතු සිදු කිරීමට පෙර ගවේෂණ හා මිනුම් කටයුතු සිදු කිරීම

සංරක්ෂණ අංශය

ගල මුදුනේ පැරණි ගඩොල් බැමි, සිංහපාද මළුව හා එහි බටහිර හා නැගෙනහිර බැවුම වල සංරක්ෂණය ආරම්භ කරන ලද නමුත් එම කටයුතු වසරේ මුල් මාස කීපයට සීමා විය.

ගල මුදුන දක්වා සංරක්ෂණ ද්‍රව්‍ය ප්‍රවාහනය කර ගැනීම ඉතා දුෂ්කර කාර්යයන් වූයේ නරඹන්නන්ට බාධා නොවන පරිදි මෙම කාර්යයන් සිදු කළ යුතු වූ නිසාය. ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා සවිකල යන්ත්‍රය ද දෝෂ සහිත වූ බැවින් ශ්‍රමිකයන් යොදවා මෙම කාර්යය කළ යුතු විය. එබැවින් අඛණ්ඩ සංරක්ෂණ කාර්යයන් ඇරඹීමට ප්‍රමාණවත් ද්‍රව්‍ය ගල මුදුනට ප්‍රවාහනය කර ගන්නා තෙක් මෙම කාර්යය අත් හිටුවන ලදි.

සිංහපාදයේ හා බැවුම් වල සංරක්ෂණය සඳහා ද වර්ෂාවෙන් බාධා ඇතිවිය. අධික වර්ෂාව හා සුළං තත්ත්වය මාස කිහිපයක් පැවතුණු අතර, ඒ කාලයේ දී මෙම කාර්යය අත්හිටුවීමට සිදු විය.

ජල උද්‍යානයේ උතුරු කොටසේ හා ශිලා උද්‍යානයේ විද්‍යාත්මක නඩත්තු කටයුතු ද අභ්‍යන්තර මාර්ග නඩත්තු කාර්යයන්ට ද අධික වර්ෂාවෙන් බාධා එල්ල විය.

කෞතුකාගාරයේ විකල්ප මාර්ගය සකස් කිරීම හා මොරගහමුල වෙළඳ කුටි නඩත්තු කාර්යයන් අවසාන කරන ලදි. පැරණි කාර්යාල ගොඩනැගිල්ල නේවාසිකාගාරයක් වශයෙන් වැඩි දියුණු කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක විය.

දඹුල්ල ව්‍යාපෘතිය

සංරක්ෂණ අංශය

මේ යටතේ ඇවරියපතහ රජමහා විහාරයේ හා මානින්ගමුව රජ මහා විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණ කටයුතු අවසාන කරන ලදි.

දඹුල්ල උයන්වත්ත විහාර ධර්මශාලාවේ වහල ප්‍රතිසංස්කරණය හා කෞතුකාගාරයේ ඉදිරපස ආරක්ෂක වැට හා ගේට්ටුවක් සකස් කිරීම අවසන් කරන ලදි.

මීට අමතරව උයන්වත්ත පන්සල හා කෞතුකාගාරය අතර ආධාරක බැම්මක් ඉදිකිරීම වර්ෂයේ අවසාන කාර්තුවේ ආරම්භ කරන ලදි.

බිතු සිතුවම් කෞතුකාගාරයේ හා අවට භූමි ප්‍රදේශය පිරිසිදු කර නඩත්තු කිරීම් ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෞතුකාගාරය ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම ද ආරම්භ කරන ලදි.

මානින්ගමුව රජමහා විහාරයේ බිතුසිතුවම්හි සංරක්ෂණ කටයුතු අවසන් කිරීමෙන් පසු

මහනුවර ව්‍යාපෘතිය

කැණීම් අංශය

වේගිරිය විහාර භූමිය ආශ්‍රිත ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව කැණීම් හා පර්යේෂණ වාර්තා සකස් කිරීම, පුරාවස්තු විශ්ලේෂණය හා ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානයේ නරඹන්න් සඳහා දේශණ, වීඩියෝ දර්ශණ හා පාසල්වල ජංගම ප්‍රදර්ශණ කාර්යයන් ද ඉටු කෙරිණි.

වේගිරිය ආශ්‍රිත ගවේෂණ කටයුතු

සංරක්ෂණ අංශය

බුළුගහතැන්න, කන්දේපිට හා අත්තරගම රජමහා විහාරවල සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක විය. මින් අත්තරගම සංරක්ෂණ කාර්යය අවසාන කරන ලදි.

මුලාදෑනි මන්දිරයේ වැඩි දියුණු කිරීම කොන්ත්‍රාත් මාර්ගයෙන් සිදු කෙරිණි. නාථ දේවාලේ සංඝාවාසයේ වහල හා රාම විහාරයේ ආවාසයේ සංරක්ෂණ කටයුතු අවසාන කාර්තුවේ ආරම්භ කරන ලදි.

2012 වසරේ දී සංරක්ෂණ අංශයේ ප්‍රමුඛතාවය හිමිවූයේ අස්ගිරිය සංකීර්ණයේ ආවාස 06 ක (තෝරදෙණිය, යටවත්ත, කොටකදෙණිය, වැල්ලව, ලේනව හා යටවර) වහල සංරක්ෂණයටයි. අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශයක් මත මාර්තු මාසයේ දී ආරම්භ කළ මෙම කාර්යයට රු.මි. 13.5 ක් වැය විය. වහල සංරක්ෂණ කටයුතු ද අවසාන කරන ලදි. නමුත් එම ගොඩනැගිලි වල කැඩී බිඳී ගිය කපරාරු කොටස් පුරවා තීන්ත ආලේපය ද කළ යුතු යැයි තීරණය කළ බැවින් ඒ කාර්යයන් ද ඇරඹීමට සිදු විය.

මීට අමතරව මල්වත්ත සංකීර්ණයේ තුම්පනේ ඉහළ පන්සල ආධාරක බැම්ම ඉදිකිරීම ද ආරම්භ කරන ලද අතර, අධික වර්ෂාපතනය හේතුවෙන් අත්හිටුවන ලදි. සෙල්ලාවලී හා මකුලේතැන්න පන්සල් වල භූ දර්ශන කටයුතු ද අවසන් කර ඇත.

අස්ගිරියේ වහල සංරක්ෂණ කාර්යයන් අගෝස්තු මස දී නිම වූ විට මැණික්හින්න රජමහා විහාරයේ සංරක්ෂණ කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදි.

බිතු සිතුවම් සංරක්ෂණ කාර්යයන් යටතේ අත්තරගම, නාපාන, කන්දෙපිට (දෙවන අදියර) හා උඩු දුම්බර දේවගිරි පුරාණ විහාරයේ සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක විය.

ව්‍යාපෘතියේ පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානය හා තාඹුගල කාර්යාල ගොඩනැගිල්ලේ වැඩි දියුණු කිරීම් හා අභ්‍යන්තර අලංකරණ කාර්යයන් සිදු කෙරිනි.

මේ අතර ව්‍යාපෘති කාර්යාල පරිශ්‍රය, මැද වාසල හා ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානය අවට පිරිසිදු කිරීම් හා ලෝක උරුම ඒකකයේ කාර්යයන් අඛණ්ඩව සිදු විය.

විශේෂතම කාර්යයක් වූයේ සංස්කෘතික ඇමතිතුමාගේ නිර්දේශය මත දඹාන වැදි නායක තිසාහාමිගේ සොහොන ක්‍රමවත්ව සැකසීම හා ඒ අවට ප්‍රදේශය භූ දර්ශණ කටයුතු ය. මෙම කාර්යය ද සාර්ථකව අවසාන කිරීමට හැකි වූයේ ඒ සඳහා දායක වූ සැමගේ උද්යෝගය හේතුවෙනි.

අත්තරගම රජමහා විහාරය සංරක්ෂණයට පෙර

අත්තරගම රජමහා විහාරය සංරක්ෂණයට පසු

රම්බා විහාර ව්‍යාපෘතිය

කැණීම් අංශය

මේ යටතේ ආරම්භ කල 17/1 ආරාම කැණීම හා රිදියගම ගවේෂණය අවසාන කරන ලදි. 10/1 ආරාම කැණීම ද ආරම්භ කළ නමුත් ප්‍රායෝගික හේතු මත තාවකාලිකව අත්හිටුවන ලදි. මීට අමතරව 21 ආරාම සංකීර්ණයේ භූ දර්ශණ සඳහා පදා ගැනීම, මැටි බඳුන් හා විශේෂිත පුරාවස්තු විශ්ලේෂණ කාර්යය ද සිදු කරන ලදි.

සංරක්ෂණ අංශය

මේ යටතේ 21 ආරාම සංකීර්ණයේ බැමි හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්වල සංරක්ෂණය අවසාන කරන ලදි.

ව්‍යාපෘතියේ අව ව්‍යුහ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අංක 01 නේවාසිකාගාරය සඳහා නව කොටසක් එකතු කිරීම, අංක 02 නේවාසිකාගාරයේ පිළිසකර කිරීම, නව මුරකුටියක් ඉදිකිරීම හා නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සිදු කරන ලද අතර, මෙම කාර්යය අවසාන කරන ලදි.

රම්බා විහාරයේ සංඝාවාසය ඉදිකිරීම ද කොන්ත්‍රාත් ක්‍රමය යටතේ අවසාන කරන ලදි.

විද්‍යාත්මක නඩත්තු යටතේ සංරක්ෂිත ස්මාරක වල අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුතු කාර්යයන් කිහිපයක් සිදු කළ අතර, අපේක්ෂිත කාර්යයන් අවසාන කරන ලදි.

ස්මාරක හා ව්‍යාපෘති භූමියේ දෛනික නඩත්තුව, රසායනාගාරය හා පැරණි බදාම සංරක්ෂණය හා නියාමනය අඛණ්ඩව සිදු කෙරිණි.

තිස්සමහාරාම ව්‍යාපෘතිය

කැණීම් අංශය

අකුරුගොඩ පුරාවිද්‍යා පර්යේෂණ කැණීම වර්ෂය පුරාම ක්‍රියාත්මක විය. රුහුණු විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් මේ සඳහා සෘජු දායකත්වයක් සපයන අතර, සියලු කැණීම් කටයුතු සිදු කෙරෙන්නේ ඔවුන් අතිනි. ප්‍රදේශයේ ඇති, වර්තමාන මිනිස් ක්‍රියාකාරකම් අවම ලෙස සිදු වූ ස්ථානයක් ලෙස මෙම කැණීම් ප්‍රදේශය හඳුනාගෙන ඇති අතර, සියවස් ගණනාවක සිට මානව ජනාවාස තිබූ බවට සාධක මතු කර ගෙන ඇත. 2012 වසර අවසානයේ දී පොළොව මතුපිට සිට මීටර් 06 ක මට්ටම දක්වා කැණීම සිදු කර ඇත. මේ වන විට කළු හා රතු වලං කැබලි, මැටි බඳුන්, පබළු, අස්ථි හා ආභරණ කොටස් ද රාශියක් හමුවී ඇත.

අකුරුගොඩ කැණීම් සිදු කෙරෙමින්

මීට අමතරව විශේෂ පුරාවස්තු ඒකකය, රසායනාගාර (කතරගම කෞතුකාගාර හා ව්‍යාපෘති), කෞතුකාගාර නඩත්තු හා ප්‍රචාරක කටයුතු ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

සංරක්ෂණ අංශය

සඳගිරිය ස්තූප පරිශ්‍රයේ සංරක්ෂණ කාර්යයන් වර්ෂය පුරාම ක්‍රියාත්මක විය. මේ යටතේ ස්තූප ගර්භයේ කුස්තුර හා ඉතුරු ගඩොල් සංරක්ෂණය, ඉහළ මළුවේ ගල් ඇතුරුම, ප්‍රාකාර බැම්ම, භූ දර්ශන හා රථගාල සකස් කිරීම, බෝධිඝරයේ හා පහළ මළුවේ නැගෙනහිර කොටසේ ආධාරක බැම්ම යන කාර්යයන් සිදු කෙරිණි. වරින් වර පුරාවිද්‍යා උපදේශක සභාවේ ද අදහස් ලබා ගනිමින් මෙම කාර්යය ඉටු කළ අතර, මුළු කාර්යයෙන් 90% ක් පමණ නිම කිරීමට හැකි විය.

සඳගිරි ස්තූපයේ සංරක්ෂණ කටයුතු සිදු කරමින්

විශේෂිත කාර්යයන් කිහිපයක් ම සංරක්ෂණ අංශය යටතේ සිදු කරන ලදි. දෙබරවැව පශ්චිමාරාම ස්තූපයේ කපරාරු සංරක්ෂණය හා හුණු ආලේපය හා තිස්ස ස්තූපයේ ගර්භයේ ඉහළ කොටසේ මතු වී ඇති සියුම් ඉරිතැලීම් ප්‍රතිසංස්කරණය සඳහා පලංචි ගැනීම ද මේ අතර වෙයි.

මීට අමතරව කතරගම සංචාරක නිවාසය නඩත්තුව, ව්‍යාපෘති පරිශ්‍රයේ නඩත්තු හා සංරක්ෂණ වාර්තා සකස් කිරීම ද ක්‍රියාත්මක විය.

ගාල්ල කොටුව ව්‍යාපෘතිය

කැණීම් අංශය

මුහුදු පුරාවිද්‍යා ඒකකය වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක වූ අතර, මේ මඟින් ලංකාවේ නැගෙනහිර, උතුර හා වයඹ වෙරළ ආශ්‍රිතව ගිලී ඇති නෞකා පිළිබඳ ගවේෂණ කිහිපයක් සිදු කරන ලදි. ඒ අතරම දැනට ගවේෂණය කර වාර්තාගත කර ඇති ගාලු වරාය ආශ්‍රිත මුහුදු පුරාවිද්‍යා වැඩබිම් වල ස්ථානීය සංරක්ෂණ කටයුතු හා නියාමනය සිදු කෙරිණි.

ගිලීගිය නෞකා පිළිබඳ ගවේෂණ කටයුතු සිදු කිරීම

මුහුදු පුරාවිද්‍යා රසායනාගාරයේ පුරාවස්තු වාර්තාගත කිරීම හා සංරක්ෂණ කටයුතු සිදු කරන ලද අතර, උප්පුවේලි ප්‍රදේශයේ ගවේෂණයේ දී සොයා ගත් පිඟන් මැටියෙන් තැනූ පුරාවස්තු විශේෂ විය.

මුහුදු පුරාවිද්‍යා රසායනාගාරයේ පුරාවස්තු සංරක්ෂණ කටයුතු

මීට අමතරව මුහුදු පුරාවිද්‍යා කෞතුකාගාරයේ නරඹන්නන් සඳහා දේශණ, වැඩමුළු, ප්‍රදර්ශණ හා දැනුවත් කිරීම් සිදු කරන ලදි. ගාලු කොටුව තුළ ඕලන්ද ගබඩා ගොඩනැඟිල්ල හා ඒ ආශ්‍රිත භූමි ප්‍රදේශයේ නඩත්තු කටයුතු ද ක්‍රියාත්මක විය.

සංරක්ෂණ අංශය

ගරුමුණි වලව්ව හා එම පරිශ්‍රයේ දෛනික නඩත්තු කාර්යයන් සිදු කරන ලදි. අතිශයින්ම ගරා වැටී ඇති බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ගොඩනැගුණු මෙම වටිනා ගොඩනැගිල්ල ඉතා ඉක්මනින් සංරක්ෂණය කළ යුතුව ඇතත් 2012 වර්ෂය තුළදී ද ඒ සඳහා වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමට නොහැකි විය.

මෙම පරිශ්‍රයේ ආරක්ෂක වැට හා ගේට්ටුව ඉදිකිරීම ද වරින් වර සුළු ප්‍රමාණ වලින් සිදු කෙරුණු අතර, අවශ්‍ය කම්කරුවන් ලබා ගැනීමට නොහැකි වීම ගැටළුවක් විය.

වයඹ සංස්කෘතික චතුරශ්‍රය

යාපහුව වැඩබිම

කැණීම් අංශය

අංක 04 ගුහාවේ පර්යේෂණ කැණීම, පිය දිය අගල, නාගොල්ල රජමහා විහාරයේ පධානඝර සංකීර්ණය, බංගලාපිටිය පර්යේෂණ කැණීම, හාතිගමුව ගුරුගොඩ විහාරය, බංගලාපිටිය පොකුණ හා අඹන්පොල ගුරුගොඩ විහාරය යන කාර්යයන් සිදු කරන ලදි. මේ අතරින් හාතිගමුව විහාරයේ හා අඹන්පොල ගුරුගොඩ විහාරයේ කැණීම් අවසාන කරන ලදි. අධික වර්ෂාව හේතුවෙන් පිට දිය අගල හා බංගලාපිටිය පර්යේෂණ කැණීම වසරේ අවසාන කාර්තුවේ දී නවතා දැමීමට සිදු විය.

නාගොල්ල රජමහා විහාරයේ කැණීම් කටයුතු

සංරක්ෂණ අංශය

බංගලාපිටිය ස්තූපයේ සංරක්ෂණයත්, ඊට සමගාමීව එහි ඇතුළු මළුව හා පිටත ප්‍රාකාරය ප්‍රතිසංස්කරණයත් සිදු කෙරිණි. දළඳා මළුව හා ගල මුදුන අතර පැරණි ගල් පඩි පෙළ සංරක්ෂණයත්, ඒ අතර මෙහි දෙවන අදියර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය කර ගැනීමත් සිදු කරන ලදි.

දළඳා මළුව හා ගල මුදුන අතර පැරණි ගල් පඩි පෙළ සංරක්ෂණය

කයිකාවල රජමහා විහාරයේ ප්‍රකාර බැම්ම, යාපහුව රජමහා විහාරයේ සණ්ඨා කුළුණ යන කාර්යයන් ද සිදු කළ අතර කයිකාවල ප්‍රාකාරය අවසන් කරන ලදි.

පිට දිය අගල හා ගල මුදුන දක්වා පඩිපෙළ දෙවන අදියර ද නොවැම්බර් මාසයේ දී ආරම්භ කිරීමට හැකි විය.

බිතුසිතුවම් සංරක්ෂණ යටතේ නාගොල්ල රජමහා විහාරයේත්, කඩවලගෙදර රජමහා විහාරයේත් සංරක්ෂණ අවසන් කරන ලදි. මීට අමතරව බලල්ල රජමහා විහාරයේ සංරක්ෂණ කාර්යය වසර අවසානය දක්වා සිදු කෙරිණි.

ව්‍යාපෘතියේ කාර්යාල ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමත්, ගබඩා පහසුකම් සපයා ගැනීමටත් කටයුතු කරන ලදි.

ව්‍යාපෘති භූමියේ නඩත්තු කටයුතු ද වර්ෂය මුළුල්ලේ ම සිදු කෙරිණි.

දඹදෙණිය වැඩබිම

කැණීම් අංශය

දඹදෙණිය මාලිගා ගල ගවේෂණය, විජේසුන්දරාරාම පිට පවුර හා එම පරිශ්‍රයේ වාර්තාකරණය, නාරම්මල රජමහා විහාරය හා ගල්දෙණිය රජමහා විහාරයේ ගවේෂණය අවසාන කරන ලදි. විජේසුන්දරාරාම දකුණු බැම්මේ පර්යේෂණ කැණීම වසරේ තුන්වන කාර්තුවේ දී ආරම්භ කරන ලදි.

සංරක්ෂණ අංශය

විජේසුන්දරාරාම විහාරයේ ප්‍රාකාර බැම්මේ උතුරු කොටස, කළුන්දෑව රජමහා විහාරය සහ නාරම්වල රජමහා විහාරයේ ප්‍රවේශ මාර්ගයේ වැඩි දියුණු කිරීම් කරන ලදි. මීට අමතරව විජේසුන්දරාරාම විහාරයේ විශ්‍රාම ශාලා ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිකිරීම ද ක්‍රියාත්මක විය.

බිතුසිතුවම් සංරක්ෂණය යටතේ රුක්මලේ ගිරිගුහාරාමය හා සිරිගල රජමහා විහාරයේත් සංරක්ෂණ කටයුතු අවසාන කළ අතර, නාරම්මල රජමහා විහාරයේ සංරක්ෂණය අවසාන වෙමින් පැවතිණි. බෝපිටිය රජමහා විහාරයේ සංරක්ෂණය ඔක්තෝබර් මස දී ආරම්භ කරන ලදි.

මීට අමතරව කාර්යාල ගොඩනැගිල්ලට අලුතින් කොටසක් ඉදිකිරීම හා එහි පහසුකම් වැඩි දියුණු කිරීම, මුර කුටියක් ඉදි කිරීම හා කාර්යාල පරිශ්‍රයේ නඩත්තු කාර්යයන් ද සිදු කරන ලදි.

පඬුවස්නුවර වැඩබිම

කැණීම් අංශය

නිකසලා නුවර රජමහා විහාර භූමියේ පැරණි ගොඩනැගිලි 02 (NNB1, NNB2) එහි පැරණි දොරටුව හා ප්‍රාකාරය, පඬුවස්නුවර රජමහා විහාරයේ පිරිවෙන හා ආවාසය අතර ඇති නටබුන් වූ ගොඩනැගිල්ලක් කැණීම් කරන ලදි. මේ අතරින් NNB1 කැණීම අවසාන කරන ලදි.

NNB1 කැණීම ආරම්භ කිරීමට පෙර

NNB1 කැණීම අවසාන කිරීමෙන් පසු

කැණීමෙන් ලද සුවිශේෂී සාධක

සංරක්ෂණ අංශය

මේ යටතේ සංරක්ෂණ කටයුතු 04 ක් යෝජනා කර තිබූ නමුත් අවශ්‍ය කම්කරුවන් හා අධීක්ෂණ නිලධාරීන් නොමැති බැවින් ආරම්භ කළ නොහැකි විය.

බිතු සිතුවම් සංරක්ෂණය යටතේ නිකසලානුවර රජමහා විහාරයේ ගුහාව හා පඬුවස්නුවර ටැම්පිට විහාරයේ සංරක්ෂණය සිදු කරන ලදි.

කුරුණෑගල වැඩබිම

කැණීම් අංශය

රිදී විහාරයේ පැරණි සොහොන කැණීම අවසාන කරන ලදි.

පැරණි සොහොන කැණීම් සිදු කිරීමට පෙර

පැරණි සොහොන කැණීම් සිදු කිරීමෙන් පසු

සංරක්ෂණ අංශය

සැරසුම්ගල දක්වා ඇති පඩිපෙල දෙපස කළු ගල් බැම්ම හා කැණීම් අවසන් කළ පැරණි සොහොනේ සංරක්ෂණ කටයුතු අරඹන ලදි.

සැරසුම්ගල ගල් පඩිපෙල සංරක්ෂණයට පෙර

සැරසුම්ගල ගල් පඩිපෙල සංරක්ෂණය අතරතුර

මීට අමතරව ව්‍යාපෘතිය සඳහා වැසිකිළි ඉදිකිරීම ද කරන ලදි.

ව්‍යාපෘති භූමියේ නඩත්තු කටයුතු ද සිදු කරන ලදි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ටීඑම්/ජී/සීසීඑෆ්/2012/එෆ්ජී

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 දෙසැම්බර් 23 දින

අධ්‍යක්ෂ ජනරාල්,

මධ්‍යම සංස්කෘතික අරමුදල.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 <u>**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.රා.අ.ගි. ප්‍ර.)

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 106 ඡේදය අනුව වියදම් අයිතම ප්‍රමාණවත් වන විට ඒ පිළිබඳව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කළයුතු වුවද පිළිවෙලින් රු.318,880,051 ක්, රු.56,299,899 ක් හා රු.27,825,804 ක් වූ කැණීම් හා සංරක්ෂණ වියදම්ද, ප්‍රවේශපත් මුද්‍රණ වියදම් සහ ඉන්ධන හා ලිහිසි තෙල් වියදම් ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සුනාමි කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබුණු ගාල්ල නුගගහවත්ත ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. 2005 වර්ෂයේ එම ඉඩම මිලදී ගැනීමේදී එහි වටිනාකම රු.2,558,000 ක් විය.

(ආ) සීගිරිය ව්‍යාපෘතියේ සංචාරක කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ජපන් රජයේ ආධාර මත 2009 වර්ෂයේදී ලැබී තිබූ වාහනය ආනයනයේදී ගෙවීමට සිදුවූ බදු හා ගුදම් ගාස්තු රු.5,067,106 ක මුදල පමණක් එම වාහනයේ වටිනාකම ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. වාහන ලේඛනය අනුව එහි වටිනාකම රු.8,500,000 ක් ලෙස දක්වා තිබූ අතර වාහනයේ සාධාරණ වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විදේශ ආධාර ප්‍රදානයන් ලෙස 1984 සිට 2004 දක්වා කාලය තුළ ලැබී තිබූ වාහන 21 කින් රක්ෂණය කරන ලද වටිනාකම රු.5,823,900 ක් වූ වාහන 15 ක සාධාරණ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 1982 සිට පැවත එන නමුත් මේ වන විට ක්ෂය කර අවසන්ව ඇති රු.102,397,951 ක් පිරිවැය වූ ලිබඩු හා සවිකිරීම් සහ උපකරණවල ධාරණ අගය නිශ්චය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදල සතුව වාහන 117 කින් වාහන 98 ක් 2011 දෙසැම්බර් 31 වන විටත් ක්ෂය කර අවසන් ඒවා විය. එම වාහන 98 න් 34 ක් 2012 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබූ නමුත් පිරිවැය රු.15,512,727 ක් වූ වාහන 64 ක් ප්‍රත්‍යාගණන කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කැබ් රථයක ප්‍රත්‍යාගණිත වටිනාකම රු.1,250,000 ක් ලෙස ගිණුම්වලට ගෙන තිබුණද තක්සේරු වාර්තාවල එම කැබ් රථය ඇතුළත්ව නොතිබුණි.

(උ) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය සිමෙන්ති කොන්ක්‍රීට් ගල් අතුරා වැඩිදියුණු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබූ රු.4,548,648 ක් සංරක්ෂණ වියදම් යටතේ නොදක්වා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කොට තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල, පිරියත හා උපකරණවල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කරතිබුණි.

(ඌ) 2012 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන්ව නොතිබූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් වර්ෂය තුළදී දරන ලද රු.414,149 ක් හා රු.139,686 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත නොකර අදාල වත්කම් ගිණුමට හර කිරීමෙන් ප්‍රාග්ධනිත කොට තිබුණි.

(එ) 2009 වර්ෂයේදී සේවක අර්ථ සාධක අරමුදල වෙත දායක මුදල් යැවීමට ප්‍රමාද වීම මත ගෙවීමට සිදුවී තිබූ අධිභාර රු.3,731,926 ක් හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2011 වර්ෂයේ සිට පෙර වර්ෂ 12 කට අදාලව ගෙවීමට සිදුව තිබූ රු.1,782,000 ක් සඳහා එම වර්ෂයන්හි ප්‍රතිපාදන වෙන් කිරීමෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ වියදමට ලියා හැර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය රු.5,513,926 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) වර්ෂ 5 කට වැඩි කාලයක සිට පවත්නා රු.71,766 ක්වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් අවිනිශ්චිත ගිණුමක නොදක්වා විවිධ ණයගැතියන් තුළ ඇතුළත් කර ගිණුම්ගත කර තිබුණි.

2.2.3 **ලැබිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථිර සේවකයින් 24 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින වසර 5 කට වඩා පැරණි රු.720,663 ක ඒකාබද්ධ ණය ශේෂයක් ද, ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවූ කම්කරු සේවකයින් වෙත ලබාදී තිබූ අවුරුදු 5 කට වඩා පැරණි රු.366,721 ක ආපදා ණය ශේෂයක් ද 2012 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටව පැවතුණි.

(ආ) ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ගිණුම් ශේෂවල ඇතුලත් වර්ෂ 05 කට වඩා පැරණි රු.1,289,871 ක් වූ උත්සව හා විශේෂ අත්තිකාරම් ශේෂයක් 2012 දෙසැම්බර් 31 දිනවන විටත් අයකර ගත නොහැකිව තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය හා සීගිරිය ව්‍යාපෘති කාර්යාලය වෙත ලබාදුන් අත්තිකාරම් රු.504,465 ක් වර්ෂ 2 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින අතර වර්ෂ 7 කට වැඩි කාලයක සිට පවතින රු.44,534 ක උසාවි තැන්පතු ශේෂයක් ද අයවිය යුතු ශේෂ ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයනොවී පවතින රු.526,610 ක ණයගැති ශේෂයක් ප්‍රවර්තන වර්ෂයේ අවසානයට තවදුරටත් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම**

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
විශේෂ අරමුදල් ශේෂ	5,797,169	විශේෂ අරමුදල් ශේෂ 07 කට අදාල වටිනාකමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට හැකි සාක්ෂි.
ජංගම වත්කම් - විවිධ ණයගැතියෝ	1,060,752	වර්ෂ 2 සිට 5 දක්වා කාල පරිච්ඡේදයකට අයත් ණයගැතියන් පිළිබඳ විස්තරාත්මක උපලේඛන

ජංගම නොවන වත්කම් - ව්‍යාපෘති කාර්යාල අත්තිකාරම්	4,604,220	විස්තරාත්මක උපලේඛන
හිඟහිටි සේවක ණය	2,377,255	කාල විශ්ලේෂණ
- එම -	1,289,871	විස්තරාත්මක උපලේඛන

2.2.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) මුදල් රෙගුලාසි	
372 (2)	අදාල කාර්යය නිමවූ විගසම තත් කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, ආයතනයේ නිලධාරීන් 10 දෙනෙකු විසින් අවස්ථා 12 කදී ලබාගත් එකතුව රු.593,040 ක්වූ අග්‍රිම පියවීම සඳහා මාස 2 සිට 8 දක්වා කාලයක් ගතකර තිබුණි.
685	අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය යන සිද්ධස්ථාන අළලා වාර්තා චිත්‍රපටයක් නිපදවීම සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව නිෂ්පාදකවරයකු සමග රු.4,701,000 ක කොන්ත්‍රාත්තුවක් සඳහා ගිවිසුමකට එළඹී තිබුණි.
(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
5.3.1 (ඈ)	2012 වර්ෂය තුළ රු.2,898,313 ක් වටිනා පරිගණක 34 ක්ද පරිගණක UPS 17 ක්ද මිලදී ගැනීමේදී ප්‍රසම්පාදනය සඳහා පිළියෙල කළ ලංසු කැඳවීමේ සියලු ලේඛන තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කර අනුමත කළයුතු වුවත් එසේ කර නොතිබුණි.

5.3.1 (ඇ) සහ 6.3.6

පුස්තකාල පොත් තැන්පත් කිරීම සඳහා රු.675,000 ක් වැයකර තේක්ක අල්මාරි 20 ක් මිලදී ගැනීමේදී ලංසු ලේඛන තාක්ෂණ ඇගයීමේ කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කර අනුමත කර නොතිබුණි. එමෙන්ම ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තාගත කර නොතිබුණි.

2.2.6 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

(අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 7 වන වගන්තිය අනුව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා බවට පත්වී ඇත. එම තනතුර වෙනුවෙන් දීමනාවක් ගෙවීම සඳහා පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණ ද අරමුදල විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඔහුගේ වැටුපෙන් සියයට 33 1/3 ක් ලෙස මාසිකව රු.20,113 ක දීමනාවක් ගෙවනු ලබයි. මේ සඳහා ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 1.2 වගන්තිය හා 1999 මැයි 04 දිනැති අංක 374 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර ආයතන අධ්‍යක්ෂගේ සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ලැබිය යුතු ශේෂ ලෙස ඉදිරියට ගෙනඑන විවිධ තැන්පත් ශේෂ 9 ක එකතුව රු.152,252 ක්ද, වැටුප් අත්තිකාරම් ශේෂ 3 ක එකතුව රු.24,616 ක්ද, ඉකුත් අත්තිකාරම් ශේෂ 3 ක එකතුව රු.141,791 ක් හා මුදල් වංචාවන් 8 ක වටිනාකම රු.1,472,848 ක්ද වශයෙන් එකතුව රු.1,791,507 ක් භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන බොල් ණය ලෙස සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් කපාහැර තිබුණි.

(ඇ) මාසිකව රු.50,000 බැගින් ඉන්ධන දීමනාවක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා වෙත ලබාදීම සඳහා 2012 වර්ෂය වෙනුවෙන් රු.600,000 ක් වැයකර තිබුණි.

(ඇ) සංස්කෘතික අමාත්‍යවරයාගේ නිල නිවාසයට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2012 වර්ෂය තුළ වැය කළ මුදල රු.177,130 කි.

03. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදල් මෙහෙයුම්වලින් රු.227,294,733 ක අතිරික්තයක් පැන නැගී තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූප අතිරික්තය වූ රු. 235,009,985 ක් හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,715,252 ක අඩුවීමක් පෙන්නුම් කරයි. පෙර වර්ෂය හා සැසඳීමේදී සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම රු. 321,556,476 කින්

හා ආයෝජන ආදායම් රු.25,383,472 කින් වැඩිවී තිබුණද අරමුදලේ මෙහෙයුම් වියදම්වල වැඩිවීම ද රු. 352,590,118 ක් වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට හේතුවී තිබුණි.

3.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සමාලෝචිත වර්ෂය තුළ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම වැඩිවීම රු. මිලියන 114.9 ක් හෙවත් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 164.7 ක් වී තිබූ අතර, වෙනත් වියදම් වැඩිවීම රු. මිලියන 71.06 ක් හෙවත් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 138.9 ක් වී තිබුණි. වැටුප් හා වේතන වැඩිවීම රු. මිලියන 156.7 ක් හෙවත් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 26 කි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයේ සියයට 3.28 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) සංචාරක ප්‍රවේශපත්‍ර මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබූ මුදල රු.56,299,899 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඒ සඳහා වූ වියදම් වැඩිවීම සියයට 2291 ක් විය.

04. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී අරමුදල විසින් ක්‍රියාත්මක කිරීමට ඉලක්කගතකර තිබුණු පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

විස්තරය	ඉලක්කය		තථ්‍ය කාර්ය සාධනය	
	වැඩබිම්	ඒකක	වැඩබිම්%	ඒකක%
කැණීම්	08	2856	ආරම්භ කර	නොතිබුණි
සංරක්ෂණ	14	4362	-	එම -
කතරගම කෞතුකාගාරය හදිසි සංරක්ෂණ	-	145	-	එම -

(ආ) 2012 වර්ෂයේදී අරමුදල විසින් ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කර තිබුණු පහත සඳහන් කැණීම් හා සංරක්ෂණ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉටුකර තිබුණේ අපේක්ෂිත ඉලක්කයන්ගෙන් සියයට 71 කි.

විස්තරය	ඉලක්කය			තථ්‍ය කාර්ය සාධනය			
	වැඩබිම්		ඒකක	වැඩබිම්%		ඒකක%	
කැණීම්	82	233	193521	42	18	137893	71
සංරක්ෂණ	151						

(ඇ) හදිසි සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම, පර්යේෂණ නිලධාරීන්, සංරක්ෂණ පරීක්ෂක නිලධාරීන් හා කම්කරුවන් හිඟතාවය, ටෙන්ඩර් තීරණ ප්‍රමාදවීම, සම්පත් හිඟතාවය හා අධික වර්ෂාව පැවතීම වැනි හේතු නිසා ඉහත කැණීම් හා සංරක්ෂණ ප්‍රමාදයන් සිදුවී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 හා 2012 වර්ෂවලදී ධාවනයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ වාහන හතරක් වෙන්දේසි කිරීම් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) පොළොන්නරුව "ආදිත්‍ය" නිවාසය, සංචාරක බංගලාවක් ලෙස අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව රු.7,289,264 කට ආයතනයකට පවරා තිබූ අතර අලුත්වැඩියාව ප්‍රමිතියකට සිදු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු වෙතින් අඩුපාඩු සකස් කරවා ගැනීමට පියවර නොගෙන රු.1,926,514 ක්වූ අවසන් ගෙවීම 2012 ඔක්තෝබර් 24 දින ගෙවා තිබුණි.

(ඇ) 2012 ජනවාරි 01 දින සිට නව විදේශ සංචාරක ප්‍රවේශපත්‍රයක් සීගිරිය, පොළොන්නරුව, අනුරාධපුර ව්‍යාපෘති සඳහා හඳුන්වා දෙන බව මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිලධාරීන් වෙත දන්වා තිබුණි. එම උපදෙස් අනුව කටයුතු නොකර පැරණි වටරවුම් විදේශ සංචාරක ප්‍රවේශපත්‍ර තවදුරටත් මුද්‍රණය කර තිබූ අතර එම ප්‍රවේශපත් 2994 ක් 2012 ජනවාරි 01 දිනෙන් පසු අලෙවි කර තිබුණි. ඒ අනුව නව ප්‍රවේශපත්‍ර මිලට වඩා අඩු මිල වූ වට රවුම් ප්‍රවේශපත්‍ර අලෙවියෙන් රු.10,329,300 ක අලාභයක් සිදුවී තිබූ අතර ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරාවිද්‍යා කැණීම් වලදී හමුවී තිබෙන අභයගිරිය කෞතුකාගාරයේ තැන්පත් කර තිබුණු වර්ග 18 කට අදාල පුරා වස්තු අයිතම 517 ක්ද, අභයගිරිය ව්‍යාපෘතියේ විශේෂ පුරා වස්තු ලෙස සේප්පුවල තැන්පත් කර තිබූ රන්, රිදී, ලෝකඩ, පලිඟු, මැණික් හා වෙනත් ලෝහ වර්ගවලට අයත් භාණ්ඩ හා භාණ්ඩ කැබලි අයිතම 218 ක්ද වශයෙන් පුරා වස්තු විශාල ප්‍රමාණයක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු සමීක්ෂණයකට ලක් කර ලේඛනගත කර නොතිබුණි.

(ආ) 1978 වර්ෂයේ දිවයිනට වැඩම කරන ලද කපිල වස්තු සර්වඥ ධාතූන් වහන්සේලාට පූජා කරන ලද පසුව මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත භාරදී තිබුණු රන් හා වෙනත් ආභරණ වර්ග දළ වශයෙන් අයිතම 424 ක්ද, නිදන් කිරීම සඳහා රන් හා වෙනත් ආභරණ හා භාණ්ඩ වර්ග දළ වශයෙන් අයිතම 294 ක්ද, කෞතුකාගාරයට භාරදීම සඳහා ආභරණ හා භාණ්ඩ වර්ග අයිතම 42 ක්ද හා පූජා භාණ්ඩ වර්ග අයිතම 42 ක්ද වශයෙන් හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට එම භාණ්ඩ අයිතම සමීක්ෂණයකට ලක්කර වටිනාකම් ගණනය කර ලේඛනගත කර නොතිබුණි.

(ඇ) අභයගිරිය ව්‍යාපෘති භූමිය තුළ රටඋළු 2085 ක්, අඩකව උළු 3725 ක්, ස්කෘ ඇණ 2175 ක් හා සරනේරු 133 ක් ඇතුළු වෙනත් ගබඩා ද්‍රව්‍ය දීර්ඝ කාලයක සිට අතිරික්ත තොග ලෙස රඳවාගෙන තිබුණි.

(ඈ) අභයගිරිය ස්තූප ව්‍යාපෘතියෙන් ගලවා ඉවත් කරන ලද යකඩ බට, කප්ලින්, ලැලි, w.500 හැලජන් ලාම්පු සහ වෙනත් ගබඩා ද්‍රව්‍ය ව්‍යාපෘතියේ නිලධාරීන් හාබාහිර පුද්ගලයින්ගේ පෞද්ගලික අවශ්‍යතා සඳහා නිසි අවසරයකින් තොරව නිකුත් කර තිබුණි. එසේ නිකුත් කළ නිලධාරීන් හා භාණ්ඩ රැගෙන ගොස් ආපසු භාර නොදුන් නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) "සීගිරි සංස්කෘතිකාභිමුඛ සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය " (The Project of Culture Oriented Tourism Pomotion in Sigiriya) යටතේ අමුත්තන් සඳහා විවේක පහසුකම් සැපයීම වෙනුවෙන් ලැබී තිබුණු රු. මිලියන 4.5 ක මුදල විශේෂ අරමුදලක් ලෙස ගිණුම්ගත නොකර රාජ්‍ය ප්‍රදාන යටතේ ආදායමට ගෙන තිබුණි.

(ii) වයඹ සංස්කෘතික චතුරශ්‍රයේ කටයුතු කඩිනමින් ඉටු කිරීමට යයි සඳහන් කොට මෙම සේවකයන් ලබාගෙන තිබුණද, ඔවුන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ මෙන්ම වෙනත් සේවා ස්ථානවලද සේවයෙහි යොදවා තිබුණි. තවද අවශ්‍ය කම්කරු ශ්‍රමය පිළිබඳ ඇස්තමේන්තුවක් නොතිබුණි.

(iii) එම සමාගම පිහිටුවීමේ අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඒ සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයන් එම සමාගම මගින් සේවයේ යොදවා ගැනීම හා ඔවුන්ට වැටුප් ගෙවීමේ වැයබර සමාගම මගින් දැරීම සමාගම පිහිටුවීමේ අරමුණක් වුවත්, එම අරමුණෙන් බැහැරව ඉහත පරිදි ගනුදෙනු සිදුවී තිබුණි.

(iv) වයඹ සංස්කෘතික චතුරශ්‍රයේ කටයුතු සඳහා එම සමාගමෙන් ලබාගන්නා ශ්‍රමික මිනිස් දින 1 ක් වෙනුවෙන් අරමුදල විසින් එම සමාගමට රු.1,200 ගෙවා තිබුණද, එම සමාගම විසින් ශ්‍රමිකයන්ට දිනකට ගෙවා තිබූ මුදල රු.700 කි. එක් ශ්‍රමික දිනකින් එම සමාගමට රු.500 ක ලාභයක් උපයා ගත හැකි පරිදි මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් එම සමාගම සමඟ ගිවිසුම්වලට එළඹ තිබීම නිසා 2012 ජුනි සිට සැප්තැම්බර් දක්වා මිනිස් දින 26990 ක් ලබා ගැනීම වෙනුවෙන් එම සමාගමට රු. 13,495,000 ක ලාභයක් ඉපයීමට ඉඩකඩ සකසා තිබුණි.

(ඇ) <u>අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම්</u>

වෙනත් වියදම් (Other Expenses) යටතේ අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා වර්ෂය තුළ වැය කර තිබූ මුදල රු.32,915,635 කි. එසේ වුවද එම විෂයය යටතේ දරනු ලබන වියදම් පිළිබඳවනිශ්චිතව අර්ථ දක්වා හඳුනා ගැනීම, ඒ සඳහා නිර්ණායකයන් හා වාර්ෂික සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

(ඈ) <u>"අපේ අභිමානය" වාර්තා චිත්‍රපටිය</u>

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති නරඹන සංචාරකයන් වෙත ලබාදීමේ අරමුණින් 2011 වර්ෂයේදී එළඹි ගිවිසුමකට අනුව රු.5,191,150 ක් වැයකර අනුරාධපුරය, පොළොන්නරුව හා සීගිරිය අලලා "අපේ අභිමානය" නමින් වාර්තාමය චිත්‍රපට 3 ක් නිෂ්පාදනය කිරීමට කටයුතු කර තිබුණ ද 2012 දෙසැම්බර් අවසන් වන තෙක් එම චිත්‍රපට මහජනතාව වෙත ප්‍රදර්ශනය කර හෝ විකාශනය කර නොතිබුණි.

එසේ වුවද තවත් එවැනි වාර්තා චිත්‍රපට 3 ක් නිපදවීම සඳහා මුල් නිෂ්පාදකවරයා සමඟ 2012 දෙසැම්බර් 21 දින නැවතත් රු.2,536,000 ක ගිවිසුමකට එළඹ තිබුණි.

(ඉ) <u>ගුවන් ප්‍රවේශපත්‍ර මිලදී ගැනීම</u>

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා ඇතුළු 4 දෙනෙකුගේ ඉතාලි සංචාරයක ගුවන් ප්‍රවේශපත්‍ර මිලදී ගැනීම් වෙනුවෙන් සංස්කෘතික අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අරමුදල විසින් රු.1,187,200 ක් වියදම් කර තිබුණි. මෙම මුදල් 2013 සැප්තැම්බර් 30 දින වන විටත් එම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර නොතිබූ අතර වර්ෂයේ වියදමට කපාහැර තිබුණි. මෙම ගුවන් ප්‍රවේශපත්‍ර සඳහා වූ චෙක්පත අදාල ගුවන් සමාගම වෙත ලියා නොතිබූ අතර වෙනත් සමාගමක් නමින් ලියා තිබුණි.

4.5 <u>**ද්‍රව්‍ය අක්‍රමිකතා**</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කි.මී. 1 ක් දුරට සිමෙන්ති ගල් අතුරා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව රු.38,709,100 කට සෘජු ප්‍රසම්පාදනය යටතේ ඉදිකිරීම් සමාගමක් වෙත 2012 වර්ෂය තුළ පිරිනමා තිබූ අතර පහත සඳහන් අක්‍රමිකතා නිරීක්ෂණය විය.

(අ) ඉදිකිරීම් කාර්යය සඳහා යොදාගෙන තිබූ කොන්ක්‍රීට් ගල් නිසි ප්‍රමිතියකට නොතිබුණු බවට රජයේ විගණන අංශය හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් තහවුරු කර තිබූ අතර, ප්‍රමිතියට නොමැති එම ගල් වෙනුවෙන් රු.22,099,917 ක් ගෙවා තිබුණි.

(ආ) භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි ප්‍රමාණ පත්‍රයේ විෂය අංක 1, 2 හා 5 අයිතමයන්හි ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.4,660,998 ක් ගෙවා තිබුණි.

(ඇ) ගඩොල් ඇතිරීමට පෙර ABC ස්ථරය සියයට 40 ක් හා ගල්කුඩු මිශ්‍රණය සියයට 50 ක් වශයෙන් අඩුවෙන් යෙදීම හේතුවෙන් මාර්ගය සමතුලිතභාවයෙන් තොරව බොහෝ ස්ථානවල ගිලා බැසීම ආරම්භවී තිබුණි.

4.6 <u>**හඳුනා ගන්නා ලද පාඩු**</u>

කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අදාල ආයතන කටයුතු නොකිරීම මත අත්තිකාරම් බැඳුම්කර හා කාර්ය සාධන බැඳුම්කර අවලංගුවීමට ප්‍රථම එම මුදල් අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු නොකිරීම හේතුවෙන් පුද්ගලික සමාගම් දෙකක් වෙත 2000 වර්ෂයේදී ගෙවන ලද රු.325,000 ක් හා 2001 වර්ෂයේදී ගෙවන ලද රු.1,382,055 ක් වශයෙන් එකතුව රු.1,707,055 ක් එම වර්ෂවල සිට නොපියවන ලද අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශවල පෙන්වා තිබුණි.

එක් සමාගමකින් රු.1,382,055 ක මුදල අයකර ගැනීම සඳහා පවරා තිබූ නඩුවෙහි තීන්දුව ප්‍රකාරව 2011 ජූනි 30 දින රු.4,472,150 ක මුදලක් අරමුදල වෙත ගෙවන ලෙස සමාගමට නියෝග කර තිබුණද, 2012 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අයකර ගෙන නොතිබුණි.

4.7 **<u>වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අරමුදලේ සම්පත්</u>**

1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පරිදි රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය සම්පත් ඇතුළු අනෙකුත් සම්පත් අධීක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා නොදිය යුතු වුවත්, 1989, 2000, 2001, 2005, 2009 හා 2011 යන වර්ෂවලදී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ සේවයට මුදාහැර තිබූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 09 දෙනෙකු 2012 වර්ෂය තුළදී ද අමාත්‍යාංශ සේවයේ යොදවා තිබූ අතර 2012 වර්ෂයට අදාලව අරමුදල විසින් ඔවුන් සඳහා ගෙවා තිබුණු දළ වැටුප් එකතුව රු.2,694,912 ක් විය.එමෙන්ම 2012 ඔක්තෝබර් 01 සිට 15 දින දක්වා කාලය තුළ අරමුදලේ වාහන 2 ක් ඉහත චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ අවශ්‍යතා සඳහා ඉන්ධන සහ රියදුරු ද සහිතව ලබාදී තිබුණි.

4.8 **<u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ කම්කරු තනතුරු සංඛ්‍යාව 322 ක් වුවද, 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය ස්ථිර කම්කරු සංඛ්‍යාව 811 ක් විය. එමෙන්ම අනියම් හා තාවකාලික පදනම මතද කම්කරුවන් 315 දෙනෙකු බාහිරින් බඳවා ගෙන තිබූ අතර එයට අමතරව 2012 වර්ෂය තුළ සමාගමකින්කම්කරුවන් 450 දෙනෙකු සේවයෙහි යොදවා ගෙන තිබුණි.

ආයතනයේ අවශ්‍යතාවය අනුව නියමිත කම්කරුවන් සංඛ්‍යාව කාර්ය මණ්ඩලය තුළට ඇතුළත් කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2012 දෙසැම්බර් 31 දින වන විටත්ලබාගෙන නොතිබුණි.

(ආ) අරමුදලේ ජ්‍යෙෂ්ඨ තනතුරුවල පුරප්පාඩු නොපිරවීම හේතුවෙන් එම තනතුරු සඳහා වැඩ බැලීමට පත්වීම් කර තිබූ අතර අවුරුදු 01 සිට 03 දක්වා කාලයක් වැඩ බැලීමේ යෙදී සිටින නිලධාරීන් 14 දෙනෙකු 2012 දෙසැම්බර් 31 දින වන විටත් එම රාජකාරීවල යොදවා තිබුණි. 2012 වර්ෂය සඳහා ඔවුන් වෙත වැඩ බැලීමේ දීමනා වශයෙන් රු.632,090 ක් ගෙවා තිබුණි.

4.9 **වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්කෘතික අමාත්‍යාංශය සතු ජීප් රථයක් මධ්‍යම සංස්කෘතික අරමුදලේ භාවිතය සඳහා 2005 වර්ෂයේ සිට යොදා ගෙන තිබුණද එය විධිමත් පරිදි පවරා ගැනීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 මැයි 31 දින රු.7,900,000 කට මිලදී ගන්නා ලද ඩබල් කැබ් රථයක් අමාත්‍යවරයාගේ වාහන සංචිතය සඳහා ලබාදී තිබුණ ද , එම පැවරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණි. තවද රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති ලේකම්ගේ 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ලිපියේ 3.3 ඡේදය ප්‍රකාර ඒ සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. එමෙන්ම එම වාහනයේ ධාවන කටයුතු සම්බන්ධයෙන් ධාවන සටහන් හෝ මාසික සාරාංශ කිසිවක් පවත්වා නොතිබුණි.

05. **ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2013 මැයි 13 දින විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණද, එම මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණි. පාලක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශනවල වගකීම භාරගෙන ඒවා අනුමත කළයුතු වුවද ඒ අයුරින් කටයුතු කර නොතිබුණි.

5.2 **ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතන විසින් තම වාර්ෂික ප්‍රසම්පාදන අවශ්‍යතා සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව ප්‍රමුඛතා පෙල ගැස්මක් මගින් ප්‍රසම්පාදනයන් සිදු කරගත යුතු වුවද 2012 වර්ෂය තුළදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5.3 **අයවැය ලේඛනමය පාලනය**

2012 වර්ෂය සඳහා ආයතනය විසින් සකස් කර තිබූ සංශෝධිත අයවැය ලේඛනය සහ 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සත්‍ය ආදායම හා වියදම සැසඳීමේදී ආදායම් විෂයයන් 1 ක හා වියදම් විෂයයන් 36 ක සියයට 20 සිට සියයට 329 දක්වා වූ පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය මනා මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

06. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ තවදුරටත් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(i) ගිණුම්කරණය
(ii) කොන්ත්‍රාත් පරිපාලනය
(iii) වාහන පරිපාලනය
(iv) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය හා තොග පාලනය
(v) ප්‍රසම්පාදනය
(vi) සේවක මණ්ඩල කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

මධ්‍යම සංස්කෘතික අරමුදල
2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය

	2012	2011
	රු.	රු.
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා බැංකු	66,919,897	124,277,902
ලැබිය යුතු	31,725,169	16,787,112
තොගය	62,111,327	54,048,304
ආයෝජන	-	50,000,000
	160,756,392	**245,113,318**
ජංගම නොවන වත්කම්		
ලැබිය යුතු	149,067,966	141,484,821
විශේෂ ආධාර ව්‍යාපෘති	626,471	626,471
විදේශ ආධාර ව්‍යාපෘති	676,432	-
දේපළ යන්ත්‍ර හා උපකරණ	899,791,139	761,289,618
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	316,689,060	70,650,358
	1,366,851,068	**974,051,268**
මුළු වත්කම්	**1,527,607,460**	**1,219,164,586**
වගකීම්		
ජංගම වගකීම්		
උපචිත ගෙවීම්	67,781,230	67,258,395
ජංගම නොවන වගකීම්		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	367,413,407	342,773,911
විශේෂ ආධාර ව්‍යාපෘති	10,035,829	11,868,619
විදේශ ආධාර ව්‍යාපෘති	2,800,566	20,579,053
මුළු වගකීම්	**448,031,032**	**442,479,978**
ශුද්ධ වත්කම්	**1,079,576,429**	**776,684,608**
ප්‍රාග්ධන දායකත්වය		
සමුච්චිත අරමුදල	19,944,705	19,944,705
සංචිත	16,064,386	16,064,386
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත	451,428,000	353,250,000
විදේශ ආධාර අරමුදල	324,817,753	344,118,064
සමුච්චිත අතිරික්ත/ඌනතා ගිණුම	267,321,584	43,307,453
	1,079,576,429	**776,684,608**

මධ්‍යම සංස්කෘතික අරමුදල
2012 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා
ආදායම් වියදම් විස්තරය

	2012	2011
	රු.	රු.
ආදායම්		
ප්‍රවේශ පත්‍ර අලෙවි ආදායම	1,348,775,095	1,027,218,619
අනුරූ අලෙවි ආදායම	1,150,279	(352,749)
ප්‍රකාශන අලෙවි ආදායම	4,960,357	2,502,878
මුද්‍රණාලයේ ආදායම	462,561	5,200,781
රජයේ අරමුදල් (භාණ්ඩාගාරයේ අරමුදල)	34,500,000	25,000,000
පරිත්‍යාග බරන ආයතන වලින් ලද ආදායම	-	2,163,936
ආයෝජන ආදායම	33,883,468	8,499,996
වෙනත් ආදායම්	8,008,810	20,805,766
	1,431,740,570	**1,091,039,229**
වියදම්		
වැටුප් වේතන හා සේවක දීමනා	759,032,384	602,331,975
පාරිතෝෂික	31,636,288	71,239,003
ස්ථාවර වත්කම් ක්ෂය	26,165,069	10,387,406
අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන්	10,215,791	5,686,198
සැපයීම් හා පාරිභෝජන ද්‍රව්‍ය භාවිතය	184,750,332	69,776,803
දේපළ පිරියත හා උපකරණ හානිවීම්	37,576,846	22,009,013
කොන්ත්‍රාත් සේවා	32,531,571	22,682,340
මූල්‍ය පිරිවැය	112,345	584,243
විගණක ගාස්තු	200,000	175,000
වෙනත් වියදම්	122,225,211	51,157,262
	1,204,445,836	**856,029,244**
වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය	**227,294,733**	**235,009,985**

මධ්‍යම සංස්කෘතික අරමුදල
2012 දෙසැම්බර් මස 31 වන දින අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

<u>මෙහෙයුම් අයිතමයන් වලින් උත්පාදනය වූ මුදල් ප්‍රභවය</u>

වසරේ අතිරික්තය / ඌණතාවය		227,294,733
ගැලපීම් - මූල්‍ය නොවන අයිතම		
ක්ෂය වීම්	26,165,069	
පෙර වර්ෂය සඳහා ගැලපීම්	(3,280,602)	
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	31,636,288	54,520,755
කාරක ප්‍රාග්ධන අයිතම ගැලපීමට පෙර මෙහෙයුම් ප්‍රතිඵල		**281,815,488**
<u>කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්</u>		
ලැබිය යුතු	(7,583,145)	
තොග	(8,063,023)	
උපචිත ගෙවීම්	522,835	(15,123,332)
මෙහෙයුම් කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රභවය		**266,692,156**
ආයෝජන කටයුතු මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් මිළදී ගැනීම	(107,211,266)	
ආයෝජන (වැඩිවීම/අඩුවීම)	(196,038,702)	
දිගුකාලීන ආයෝජන (වැඩිවීම/අඩුවීම)	(14,938,057)	
ආයෝජන කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(318,188,025)**
<u>මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය</u>		
විදේශ සම්පත් අරමුදල	21,422,365	
පාරිතෝෂික ගෙවීම්	(6,996,792)	
විශේෂ ආධාර ව්‍යාපෘති	(1,832,790)	
විදේශ ආධාර ව්‍යාපෘති	(18,454,919)	
මූල්‍ය අයිතමයන්ගේ මුදල් භාවිතය		**(5,862,137)**
ශුද්ධ මූල්‍ය අඩුවීම - මුදල් හා මූල්‍ය සමාන අයිතම		**(57,358,006)**
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන අයිතම		124,277,902
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතම		**66,919,896**

2012 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	විදේශ සංචිත අරමුදල්	සමුච්චිත අතිරික්තය	එකතුව
2011/01/01 දිනට ශේෂය	**19,944,705**	**16,064,386**	**0**	**0**	**(210,128,811)**	**(174,119,720)**
එකතු කළා :						
ප්‍රත්‍යාගණන අතිරික්තය			353,250,000			353,250,000
විදේශ අරමුදල්				402,446,592		402,446,592
වසර සඳහා අතිරික්තය					235,009,985	235,009,985
පෙර වසරේ ගැලපුම්					18,426,279	18,426,279
	19,944,705	**16,064,386**	**353,250,000**	**402,446,592**	**43,307,453**	**835,013,136**
අඩු කළා :						
ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන				(58,328,529)		
2011/12/31 දිනට ශේෂය	**19,944,705**	**16,064,386**	**353,250,000**	**344,118,064**	**43,307,453**	**776,684,608**
එකතු කළා :						
ප්‍රත්‍යාගණන අතිරික්තය			103,535,000			103,535,000
විදේශ අරමුදල්				21,422,365		21,422,365
වසර සඳහා අතිරික්තය					227,294,733	227,294,733
පෙර වසරේ ගැලපුම්						
	19,944,705	**16,064,386**	**456,785,000**	**365,540,42**	**270,602,186**	**1,128,936,707**
අඩු කළා:						
පෙර වසරේ අඩුවීම්			(5,357,000)	(40,722,676)		(46,079,676)
පෙර වසරේ ගැලපුම්					(3,280,602)	(3,280,602)
2012/12/31 දිනට ශේෂය	**19,944,705**	**10,064,386**	**451,428,000**	**324,817,753**	**267,321,584**	**1,079,576,429**